

**<u>කොරියානු භාෂා පරීක්ෂණය සඳහා ලියාපදිංචි කිරීම-2024</u>**

**<u>(නිෂ්පාදන, ධීවර, නැව් කර්මාන්තය, ඉදිකිරීම්, සේවා 1 සහ සේවා 2)</u>**

**<u>අයදුම්කරුවන් සඳහා උපදෙස්</u>**

**විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම 2024.02.26-2024.02.29 වන දින දක්වා පමණක් සිදු කරනු ලැබේ.**

**විභාග ප්‍රවේශපත්‍ර ලබාගැනීමට නම් ඔබ සම්පූර්ණ කර තිබිය යුතු සුදුසුකම්:-**

1. වයස අවුරුදු 18 - 39 අතර අයෙකු වීම. ( 1984 පෙබරවාරි 27 සිට 2006 පෙබරවාරි 26 දක්වා උපන් අයෙකුවීම
2. උසාවියකින් අපරාධ සම්බන්ධ නඩු නිමිත්තක වරදකරුවෙකු වී දඩ මුදල් ගෙවීමක්,සිරදඬුවම් හෝ බරපතල දඬුවම් නොලැබුණු අයෙකු විය යුතුය.
3. කොරියානු ජනරජයෙන් ආපසු හරවා හෝ නෙරපා එවූ අයෙකු නොවිය යුතුය.
4. මෙරටින් බැහැරවීම් තහනම් කර ඇති අයෙකු නොවිය යුතුය.
5. වර්ණ අන්ධ හෝ වර්ණ දුර්වලකම් නොමැති අයෙකු විය යුතුය.
6. කොඳුඇට පෙල ආබාධ සහිත හෝ ඇඟිලි අඩු හෝ ඉවත් කර ඇති අයෙකු නොවිය යුතුය.(එවැනි අබාධ සහිත පුද්ගලයින්ට විභාගයට පෙනී සිටීමට අවස්ථාව හිමිවන නමුත් ඔවුන් විභාගය සමත් නොකරනු ඇත.)
7. **ඊ-9 හෝ ඊ-10 යන වීසා කාණ්ඩ යටතේ වසර 05ක් හෝ ඊට වඩා වැඩි සේවා කාලයක් දකුණු කොරියාවේ සේවය කර නොමැති අයෙකු විය යුතු ය.**


**විභාග ප්‍රවේශපත්‍රයක් ලබාගැනීමට අවශ්‍ය දෑ:-**

විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම අන්තර්ජාලය ඔස්සේ -මාර්ගගතව(online) සිදු කරන බැවින් ලියාපදිංචි වීමට පෙර පහත සඳහන් අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ඔබ සතුව තබා ගැනීමට කටයුතු කරන්න.

1. **ඉදිරියට අවම මාස 03ක කාලයක් සඳහා වලංගු විදේශ ගමන් බලපත්‍රයේ ඔබගේ ඡායාරූපය සහිත පිටුවෙහි ස්කෑන් කරන ලද JPG ඡායාරූපයක් (1MB විය යුතුය). නමුත් විභාගයට පෙනී සිටින විට ඔබ සතුව වලංගු ගමන් බලපත්‍රයක් තිබිය යුතුය.**

2. මාස 03ක් ඇතුළත ලබාගත් 3.5 cm * 4.5 cm ප්‍රමාණයේ **සුදු පැහැති** පසුබිම සහිත පැහැදිලි ස්කෑන් කරන ලද වර්ණ ඡායාරූපයක් (JPG විය යුතුය) සුදු පැහැති ඇඳුමකින් සැරසී ඡායාරූපය ගැනීමෙන් වැළකී සිටිය යුතුය.

   - Photo resolution : 100-300 pixels
   - File type: Only JPG
   - File Size: 1MB
   - ඔබගේ මුහුණ පැහැදිලිව පෙනීම අනිවාර්යය වන අතර,ඡායාරූපය සඳහා බෝඩර්,අකුරු ආදිය ඇතුළත් නොකළ යුතුය.
   - ශරීරය ඍජුව තබා ඡායාරූපය ලබා ගත යුතුය.
   - ඇස් කණ්ණාඩි නොපැළඳ ඡායාරූපය ලබාගත යුතුය.




**වර්ණ අන්ධතාවය,වර්ණ දුර්වලතාවය ඇති අයදුම්කරුවන් හට පරීක්ෂණය සමත්වීමට අවසර නොලැබේ. විභාගය සඳහා ලියාපදිංචි වීමට ප්‍රථම වර්ණ අන්ධතාවය,වර්ණ දුර්වලතාවයක් නොමැති බවට තහවුරුවක් ලබාගැනීම ඔබගේ වගකීමක් වේ. වර්ණ අන්ධතාවය පරීක්ෂා කර ලබාගත් වාර්තාව විභාග ප්‍රවේශපත්‍ර අයදුම් කිරීමේදී Upload නොකළ යුතුය.**

**ඔබ විභාගය සමත්වීමෙන් පසුව කොරියානු රැකියා වෙබ් අඩවියට ලියාපදිංචි වීමට පෙර සිදු කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයේදී නැවතත් වර්ණ අන්ධතාවය පරීක්ෂාවට ලක් කරනු ලබන අතර එම අවස්ථාවේදී ඔබට වර්ණ අන්ධතාවය ඇති බවට තහවුරු වුවහොත් ඔබගේ විභාග ප්‍රතිඵල අවලංගු වනු ඇත.**

## 3. විභාග ප්‍රවේශපත්‍ර ගාස්තුව- ඇමරිකානු ඩොලර් 28 ට සමාන මුදල (රු. 8,887/- )

මෙම ප්‍රවේශපත්‍ර ගාස්තුව ගෙවීම් කිරීමේදී ඔබට ආසන්නතම ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ලංකා බැංකුව හෝ මහජන බැංකුවෙහි පහත සඳහන් ගිණුම් අංකය වෙත මුදල් බැර කළ යුතුය.

- 100-800-44-2461 - ජාතික ඉතිරි කිරීමේ බැංකුව (බත්තරමුල්ල ශාඛාව)
- 0000001650 - ලංකා බැංකුව ( ආයතනික ශාඛාව)
- 208100151791068 - මහජන බැංකුව (බත්තරමුල්ල ශාඛාව)

**විභාග ප්‍රවේශපත්‍රය ලබාගැනීම සඳහා මුදල් ගෙවූ රිසිට්පත උඩුගත කිරීම (Upload) අනිවාර්යය බැවින්, 2024.02.21 වන දින සිට 2024.02.28 අතර කාලය තුළ අනිවාර්යෙන්ම මුදල් ගෙවීම සිදු කල යුතුය.**

**මුදල් ගෙවූ රිසිට්පත ස්කෑන් කර (File Size: 1MB) තබා ගැනීමට කටයුතු කළ යුතුය.Online/ATM භාවිතයෙන් ගෙවීම් සිදු නොකල යුතුය.**

**බැංකු රිසිට්පත සම්පූර්ණ කිරීමේදී අනිවාර්යයෙන්ම ඔබගේ නම,ලිපිනය, ගමන් බලපත්‍ර අංකය, ජාතික හැඳුනුම්පත් අංකය,දුරකථන අංකය,මුදල් ගෙවන හේතුව ලෙස "EPS-TOPIK -2024 විභාග අයදුම්පත් ගාස්තු" ලෙස සඳහන් කල යුතු අතර, ඔබගේ ගමන් බලපත්‍රයේ සඳහන් පරිදි අත්සන පැහැදිලිව සටහන් කළ යුතුය.ඉහත සියළු තොරතුරු සටහන් නොකර මුදල් ගෙවීම් සිදු කරන පද රිසිට්පත් ප්‍රතික්ෂේප වනු ඇත.**

**බැංකු රිසිට්පත සම්පූර්ණ කළ යුතු ආකාරය- වර්ණ කර ඇති සියලුම විස්තරයන් සම්පූර්ණ කළ යුතුය.**

## BANK OF CEYLON — Bankers to the Nation

මුදල් තැන්පතු පත්‍රිකාව / Cash Deposit Slip

| Field | Entry |
|---|---|
| දිනය / Date | 2024 |
| Account / Card Number | 0000001650 |
| Account / Card Holder's Name and Address | S.L.B.F.E |
| For cash deposits above Rs. 200,000 deposited by Person other than A/C Holder/Card Holder — Depositor's Name and Address | තැන්පත්කරුගේ නම පැහැදිලිව සඳහන් කරන්න. |
| N.I.C / P.P / D.L.No. | ගමන් බලපත්‍ර අංකය ලියන්න. |
| Telephone No | ඔබගේ දු:අංකය සඳහන් කරන්න. |
| Purpose of Deposit | EPS - TOPIK - 2024 (Normal) |
| Depositor's Signature | අත්සන යොදන්න. |
| Total | 8 887 00 |

| Notes | Rs. | Cts. |
|---|---|---|
| 5000 /- | | |
| 2000 /- | | |
| 1000 /- | | |
| 500 /- | | |
| 200 /- | | |
| 100 /- | | |
| 50 /- | | |
| 20 /- | | |
| 10 /- | | |
| Coins | | |
| Total | 8 887 | 00 |

Validation checked

Signature

## NSB — NATIONAL SAVINGS BANK

ජාතික ඉතිරිකිරීමේ බැංකුව — CASH DEPOSITS — මුදල් තැන්පතු / பண வைப்பு

| Field | Entry |
|---|---|
| Name | S.L.B.F.E |
| Bill / Account No. | 100-800-44-2461 |
| Amount (Rs.) | 8,887.00 |
| Amount in Words | අටදහස් අටසිය අසූහතයි පමණි. |
| Signature | ඔබගේ අත්සන |
| Date | 2024. . |

Received Passbook/

For Cash deposits of Rs. 200,000c or above made by a person other than the account holder

| Field | Entry |
|---|---|
| Depositor's Name | ඔබගේ නම පැහැදිලිව සඳහන් කරන්න. |
| Depositor's Address | ලිපිනය ලියන්න. |
| NIC No. | ගමන් බලපත්‍ර අංකය |
| Tel. No | දු:අංකය |
| Purpose of Deposit | EPS - TOPIK - 2024 (Normal) |

| Notes | Rs. | Cts. |
|---|---|---|
| 5000 X | | |
| 2000 X | | |
| 1000 X | | |
| 500 X | | |
| 100 X | | |
| 50 X | | |
| 20 X | | |
| Other | | |
| Total | 8887 | 00 |

For office use only

Teller

Valid if overprinted or signed by an officer

## PEOPLE'S BANK

මුදල් තැන්පතු පත - ඉතුරුම් — CASH DEPOSIT SLIP - SAVINGS — Form No. 213/1 DP

| Field | Entry |
|---|---|
| Date | 2024 |
| Account Number | 208100151791068 |
| Name of Account Holder | S.L.B.F.E |
| Amount in words | අටදහස් අටසිය අසූහතයි පමණි. |

For cash deposits above Rs. 200,000 deposited by Person other than the A/C Holder

| Field | Entry |
|---|---|
| Name | ඔබගේ නම සඳහන් කරන්න |
| Address | ලිපිනය ලියන්න |
| Telephone No | දු: අංකය |
| NIC/PP/DL No. | ගමන් බලපත්‍ර අංකය |
| Purpose | EPS - TOPIK - 2024 (Normal) |
| Cash Depositor's Signature | |
| Cashier's Signature | |

| Notes | Rs. | Cts. |
|---|---|---|
| x 5000 | | |
| x 2000 | | |
| x 1000 | | |
| x 500 | | |
| x 200 | | |
| x 100 | | |
| x 50 | | |
| x 20 | | |
| x 10 | | |
| Coins | | |
| Total | 8887 | 00 |

DO NOT WRITE ANYTHING BELOW THIS LINE

ඉතුරුම්
சேமிப்பு
SAVINGS


## විභාග අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්:-

- **පියවර 1:-**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවියට (www.slbfe.lk) පිවිස **Registration for Point System Examination -2024 (Manufacturing, Fishery, Construction, Shipbuilding, Service 1 & Service 2)** වෙත පිවිස ඔබගේ තොරතුරු ඇතුළත් කළ යුතුය.


ඔබගේ ජංගම දුරකථන අංකය නිවැරදිව ඇතුළත් කරන්න. (අප විසින් ඔබගේ ජංගම දුරකථනයට කේත අංකයක් එවනු ලබන බැවින් ඔබ මේ වන විට භාවිතා කරනු ලබන දුරකථන අංකයක් ඇතුළත් කිරීමට කටයුතු කරන්න)

ඉන් පසුව ඔබට පහත සඳහන් පරිදි තිරයක් දිස්වේ. එම තිරයේ දිස්වන සුදුසුකම් ඔබ විසින් සපුරා ඇත්නම් පමණක් **NEXT** බොත්තම **Click** කර ඉදිරියට යන්න.




.


- **පියවර 2 :-** ඉදිරියට ගිය පසුව ඔබට පහත පරිදි දිස්වන තොරතුරු ඉංග්‍රීසි කැපිටල් අකුරු භාවිතා කර ඇතුළත් කරන්න.



ඔබගේ නම ඇතුළත් කිරිමේදී ගමන් බලපත්‍රයේ Barcode/MRZ හි සඳහන් ආකාරයට ඉංග්‍රිසි කැපිටල් අකුරු භාවිතා කර ඇතුළත් කළ යුතුය.

**සැලකිය යුතුය-**

**1.ඔබගේ නම ඇතුළත් කිරිමේදී, එක් නමක් අවසානයේ එක් හිස්තැනක් පමණක් තබමින් නම ඇතුළත් කළ යුතු අතර, Barcode** / MRZ හි සඳහන් ආකාරයටම එක් අකුරක් හෝ වෙනස් නොවන පරිදි ඇතුළත් කිරීම අනිවාර්ය වේ.(එසේ නොවන අයදුම්පත් අනුමත වීම ප්‍රමාදවීම සම්බන්ධයෙන් වග කියනු නොලැබේ.)




2. ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කරන්න.
3. ගමන් බලපත්‍ර අංකය ඇතුළත් කරන්න.
4. ඔබගේ උපන් දිනය **(දිනය/මාසය/අවුරුද්ද)** වශයෙන් ඇතුළත් කරන්න.
5. ස්ත්‍රී/පුරුෂ භාවය තෝරන්න.
6. ඔබගේ ජංගම දුරකථන අංකය නිවැරදිව ඇතුළත් කරන්න.( **මෙය නැවත වෙනස් කළ නොහැක)**
7. ඔබගේ ස්ථිර පදිංචි ලිපිනය ඉංග්‍රිසි කැපිටල් අකුරු භාවිතා කර ඇතුළත් කර පදිංචි දිස්ත්‍රික්කය තෝරන්න.
8. ඊමේල් ලිපිනය ඇතුළත් කරන්න.
9. ඔබගේ ළඟම ඥාතියෙකුගේ දුරකථන අංකයක් නිවැරදිව ඇතුළත් කරන්න.

**ඉහත සියළු තොරතුරු සම්පූර්ණ කිරීමෙන් පසුව "NEXT" බොත්තම click කර ඉදිරියට යන්න.**

- **පියවර 3 :- එවිට ඔබට පහත සඳහන් තොරතුරු ඇතුළත් කළ හැකිය.**




ඔබගේ ගමන් බලපත්‍රය නිකුත් කළ දිනය සහ අවලංගු වන දිනය **(දිනය/මාසය/අවුරුද්ද)** වශයෙන් ඇතුළත් කරන්න.

- **පියවර 4 :-** ඔබ විසින් තෝරාගත් ක්ෂේත්‍රයට අදාලව අනු ක්ෂේත්‍ර අතුරින් එකක් අනිවාර්යෙන්ම තේරීම සිදු කළ යුතුය.

**නිෂ්පාදන ක්ෂේත්‍රය-**

- සැකසීම(Assembly)
- එකතු කිරීම (Joining)
- මැනීම (Measurement)

**ධීවර ක්ෂේත්‍රය-**

- මුහුදු වගාව(Sea Farming)
- ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ( In and off-shore Fishing )

**ඉදිකිරීම් -**

- **රිබාර් (**Rebar)
- **වඩුවැඩ (**Carpentry)

**නැව්තැනීම**

- පලංචිය Scaffold
- Insulation
- ඇඹරුම් යන්ත්‍රය (Grinder)
- සැකසුම් සහ සවි කිරීම (ටැක් වෙල්ඩින්) ( Welding and fit-up (tack welding))
- නල යන්ත්‍ර ඒකා බද්ධ කිරීම් සහ විදුලි කේබල් (සම්බන්ධක සහ විදුලි කේබල්, යන්ත්‍රෝපකරණ) (Piping, machinery, joinery, and electric cabling)
- නැව් කර්මාන්තයට සම්බන්ධ වෙනත් නිෂ්පාදන **(**Shipbuilding-related manufacturing, etc.)

**සේවා -1**

- ඉදිකිරීම් සහ කඩා ඉවත් කිරීම් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සහ විනාශ කිරීම (Treatment and disposal of construction and demolition waste)
- ද්‍රව්‍ය තොග ප්‍රතිචක්‍රීකරණය (Wholesale of materials for recycling)
- ශීත සහ ශීතගාර ගබඩා (Refrigerated and frozen warehousing )
- පොත්, සඟරා සහ වෙනත් ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීමට අදාල ක්‍රියාකාරකම් (Publishing of books, magazines and other publishing activities)
- සංගීත සහ ශබ්ද පටිගත කිරීම් ප්‍රකාශන කිරීම (Music and sound recordings publishing)
- ගොඩනැගිලි පිරිසිදු කිරීම (General cleaning of buildings)
- අපද්‍රව්‍ය එකතු කිරීම, ප්‍රතිකාර කිරීම සහ බැහැර කිරීමේ ක්‍රියාකාරකම් ද්‍රව්‍ය ප්‍රතිසාධනය (Waste collection, treatment and disposal activities; materials recovery)
- ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය අලෙවි කිරීමට නියෝජිතයකු ලෙස කටයුතු කිරීම (Agents involved in the sale of food, beverages and tobacco)
- නැවුම් ආහාර සහ වියලන ලද, ලුණු දැමූ සහ ශීත කළ ආහාර තොග විකිණීම (Wholesale of other fresh food and dried, salted and frozen food)
- කුරියර් සේවාව (Courier activities)
- ගුවන් ප්‍රවාහනයට සම්බන්ධ වෙනත් සේවා ක්‍රියාකාරකම් (Other service activities incidental to air transportation)
- ගුවන් සහ ගොඩබිම් භාණ්ඩ හැසිරවීම (Air and land cargo handling)

**සේවා - 2**

- හෝටල්, නිවාඩු නිකේතන සහා අනෙකුත් සාමාන්‍ය නවාතැන් සහ ඉවුම් පිහුම් පහසුකම් සහිත නවාතැන් සැපයීම ( Hotels, Resort condominium, Other general accommodation and provision of accommodation with cooking facilities)
- කොරියානු ආහාර අවන්හල් (Korean food restaurants)
-

## පියවර 5 :-

ඔබගේ ඡායාරූපය සහ ගමන් බලපත්‍රයේ ඡායාරූපය ඇතුළත් පිටුවෙහි පැහැදිලිව ස්කෑන් කරන ලද පිටපත් උඩුගත (Upload) කරන්න .

**සැලකිය යුතුයි- ඔබගේ ගමන් බලපත්‍ර පිටපත ස්කෑන් කිරිමේදී Barcode /MRZ එක කැපී නොයන පරිදි සම්පූර්ණ පිටුවෙහි පිටපතක් ස්කෑන් විය යුතුය. එසේ නොවන අවස්ථාවන්හිදී ඔබගේ විභාග ප්‍රවේශපත්‍රය අයදුම් කිරීම අනුමත නොවනු ඇත.**









**ගමන් බලපත්‍රයෙහි ස්කෑන් පිටපත හා ඡායාරූපයෙහි ස්කෑන් පිටපත උඩුගත ((Upload) කළ පසුව NEXT බොත්තම click කර ඉදිරියට යන්න. එවිට ඔබට පහත තොරතුරු ඇතුළත් කළ හැකිය.**



**පියවර 6 :-**


ඔබ විසින් විභාග ගාස්තු ගෙවීම් කළ දිනය හා බැංකුවේ නම ඇතුළත් කර බැංකු රිසිට්පතෙහි පාරිභෝගික පිටපත (Customer Copy) උඩුගත (Upload) කරන්න.

**පියවර 7 :-**

ඔබ විසින් සම්පූර්ණ කරන ලද සියළු තොරතුරු නිවැරදි බවට සහ කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනය විසින් දන්වා ඇති නීති රීති වලට එකඟ බවට, ඔබගේ ජංගම දුරකථනය වෙත ලැබෙන සත්‍යාපන කේතය (Verification code) භාවිතා කරමින් සනාථ කර ඔබගේ අයදුම්පත අප වෙත ”Apply” බොත්තම click කර යොමු කරන්න.

**ඔබට සත්‍යාපන කේතය (Verification code) ලැබී නොමැති නම් නැවත ලබාගැනීම සඳහා අදාල බොත්තම click කරන්න.**

අයදුම්පත පරීක්ෂා කිරිමෙන් අනතුරුව ඔබගේ අයදුම්පත්‍රය අප වෙත ලැබුණු බවට ඔබට කෙටි පණිවුඩයක් මඟින් දැනුම් දෙනු ලැබේ. එහි සඳහන් යොමු අංකය ඔබගේ විභාග ප්‍රවේශපත් අංකය ලෙස භාවිතා කර විභාග ප්‍රවේශපත්‍රයේ වර්ණ පිටපතක් (Colour Printout) ලබාගන්න.


Exam Admission | Point System Based Examination | South Korea | 2022 [redacted]1465

| | | |
|---|---|---|
| Admission No | : | 90901465 |
| Name | : | KUMARA DISANAYAKE |
| National identity card Number | : | 843100872V |
| Passport Number | : | N1234567 |
| Mobile Number | : | 0719632999 |
| Job Sector | : | ASSEMBELING \| |
| Applicant Signature | : | |

2022 © All Rights Reserved, Information Technology Department,
Sri Lanka Bureau of Foriegn Employment.

ඔබ විසින් ඇතුළත් කළ තොරතුරු වල යම් දෝෂයක් පවතී නම් එම අයදුම්පත් අනුමත නොවනු ඇත. එසේ අනුමත නොකිරීමට හේතුව සඳහන් කර එය නිවැරදි කරන ලෙස අප විසින් ඔබ වෙත කෙටි පණිවුඩයක් එවනු ඇත. ඒ අනුව, එම කෙටි පණිවුඩයේ සඳහන් පරිදි නිවැරදි කර අයදුම්පත නැවත යොමු කළ යුතුය.

**සියළුම අයදුම්කරුවන් ඉහත උපදෙස් අනුගමනය කරමින් විභාගය සඳහා ලියාපදිංචි වීමට කාරුණික වන්න.**